# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය
## අති විශෙෂ

අංක 243/58—1976 දෙසැම්බර් 17 වැනි සිකුරාදා—1976.12.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

(40 වැනි අධිකාරිය වූ) මහජන ආරක්ෂක ආඥාපනත

හදිසි අවස්ථා (වෙළෙඳාම විධිමත් කිරීමේ) නියෝග

හදිසි අවස්ථා (වෙළෙඳාම විධිමත් කිරීමේ) නියෝග යටතේ නියම බලධරයා වූ, ධර්මසේන විජේසිංහ වන මම, යථෝක්ත නියෝග මාලාවේ 6(3) යටතේ ක්‍රියා කරමින් කපු රෙදි වර්ග විකිණීමේදී සෑම වෙළෙන්දෙකු විසින්ම පහත සඳහන් පරිදි ක්‍රියා කළ යුතු බවට මෙයින් නියම කරමි :—

(අ) කපු රෙදි වෙළෙඳාමේ යෙදී සිටින බලය ලත් වෙළෙඳුන් සෑමවිටකම ඔහුන් සතුව ඇති කපු රෙදි තොගයන් සම්බන්ධයෙන් විස්තර පාරිභෝගිකයන්ගේ දැන ගැනීම සඳහා ප්‍රදර්ශනය කළ යුතු වේ.

(ආ) ප්‍රදර්ශනය කරන ලද මෙම තොග තත්ත්වය අඩු වශයෙන් සතිපතා නිසි ලෙස සංශෝධනය කර තම වෙළෙඳ ආයතනයේ හෝ නියමිත ගබඩාවේ තැන්පත් කර ඇති කපු රෙදි තොගයන් අනුවම විස්තර දැක්විය යුතු වේ.

(ඇ) හදිසි අවස්ථා (වෙළෙඳාම විධිමත් කිරීමේ) නියෝග යටතේ නිකුත් කර ඇති වෙළෙඳ බලපත්‍රවල සඳහන් කර ඇති ගබඩා කිරීමේ ස්ථානයන් හැර වෙනත් අනුමත කර නැති ස්ථානයන්හි අපුරා තැන්පත් කරන ලද කපු රෙදි සියල්ලක්ම අත් අඩංගුවට ගැනීමට කටයුතු කරනු ඇත.

(ඈ) ප්‍රදර්ශනය කරන ලද තොග විස්තරවලට වඩා යම්කිසි කපු රෙදි තොගයක් වෙළෙඳාම කරන ස්ථානයේ හෝ ගබඩාවේ තිබේ නම් එම අමතර තොග වහාම අත් අඩංගුවට ගැනීමට කටයුතු කරනු ඇත.

ඩී. විජේසිංහ,
නියම බලධාරී
හදිසි අවස්ථා (වෙළෙඳාම විධිමත් කිරීමේ) නියෝග.

වෙළෙඳ අමාත්‍යාංශය,
340, යූනියන් පෙදෙස,
කොළඹ 2,
1976 දෙසැම්බර් මස 17 දින.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදි

131A——ජ 24425—2,110 (76/12)